

# වම් ඉවුරේ මිනිස්සු

රාජාංගනේ මතක සටහන්

## මෙච්චර පිරිමින් ගමේ සිටිද්දිත් ගෑනු හරක් බඳිතෙයි

මාමා ඉස්සෙල්ලම යමන් තඹුත්තේගම දොළහෙ කණුවට.

මොකැ ඒ...

හාමුදුරුවො වඩම්මනකොට කුරප්පට්ටුව ගහන්න ඕනෙ.. ඕං බලාපං මාමා මම හාමුදුරුවො හත් අට නමක් උඹේ පැලට වඩම්මලා අප්පුච්චගෙ දාන මාන කටයුතු බොහොම සරුවට කරලා දෙනවා.. මෙතුවක් කල් උඹ මට ඉන්ට හිටින්ට දීලා රැකබලා ගත්ත ඒවයෙ පව් ගෙවන්ට..

අහවල් පවක් යැ.. එහෙම නොකිය... බෝ මගෙ දරු ගානයි... ගෙට ගොඩ වෙලාම යම.. රාල අඩුක්කුව උහාගෙන පිල උඩ ඔටවාගෙන ඇති..

යමන් විගැහින් සප්පායම් වෙලා දොළහෙ කණුව පැත්තට රූටමු.. මාමා උඹට කඩෙත්තුව නම් ඉඳ.. මං ගිහින් එන්නං...

යන දිග්බාගෙක මාත් කරටුව යම...

මොකාද මාමා වැට ඉමට දුව එන ගොබිලා..

නිනව් නැතුවා බොල .. ඔහෙ පල .. මේ බමුණුගොල්ලෙරාල ගේ ලොකු එකා නෙව.. අහවල් කාරියකට අඩා බුලත් ගොන්නකුත් අත ...

මාමා උඹ ගිහින් රාලට කතා කොරලා හිටින්.. මං මේකත් එක්කලා කතා කරන්නම්..

මොකෑ අඩා මේ.. ..

අයියණ්ඩි මහ බෝවට වඩින අත් දඬු එක් කරලා උඹට කියන්නෙ මටත් ඔය ගිඩි ගිඩිය කරකන්ට කියලා දියන්..

ඔහෙ පල .. මේ ගිඩි ගිඩියකරකන්ට මනාපෙන් බුලත් අත තියන්ට ඇවිත් තියෙනීනෙ.. හොඳා හොඳා.. මොකෑ බැරි.. කැලේට කොලේට වහන් වෙලා ඉන්නැතුව අත්දඬු දෙකට මේක හුරු කරගත්තොත් අපූරුයි.. කොයින් මාමාගෙ කාරියක් තියෙනවා.. ඒක අහවර වුණ ගමන් කියලා දෙඤ්ඤදං... ඔය විජායමාන පත්‍ර උරන එක නම් නවත්තන්ට වෙනවා..

කැලේ දෙයියම්පල්ලා මලිත්ති නගා කියැව්ව අයියණ්ඩි හදි ගැහෙනවා නම් තොට කංසා උරන එක නවත්තන්ට වෙයි කියලා... එදායින් පහු ඉරෙව්වෙ නැහැ අයියණ්ඩි.. බොගෙ වචනෙට ඉහළින් මං යන්නෙ නැහැ..

බොට කරදර කරනවා නේද මලයා.. මොන කරදරයක්ද මාමා.. මොනා උඹ පොදි ගහගෙන ආවෙ..? තියෙන හරුබස්ස සේරම ගෙනාවද..?

අහවල් දෙයක් කියලැයි.. අපේ එකී ගෝනල හරි කරලා වලිකුම් ආනමක් හැදී ගෑවා.. මේකා බැද්දෙ කරක්ගහලා ගඩා ගෙඩි පොදියකුයි මී පැණි ලබු කැටයක් පුරාන උහං ආවා.. ගම යන දොහක ගෙනියන්ට ඕලු හාල් මීපැණි පස්සෙන් පහු හරි කරලා දෙඤ්ඤදං..

කරදරවෙන්ට කාරි නෑ... උඹලාට කරන්නට කාරියක් තියෙනවා.. පස්සෙන් පහු කොයින් මාමා කනේ තියයි...

මැණිකෝ

ඇයි මොකද

ඉරත් හැරුණා.. අපේ මලයගෙ අඩුක්කුව හරි කරල අත තිය.. මම යනව... වැස්සි හෙට අනිද්දට පැටිය වදයි.. ඊට කලින් යාලත්තක් බාන්ට ඕනෑ ඒකිට ලගින්ට..

පුසුඹේ බැරුවා මාමා.. ගිලදානකං ලහි.. කියාපං නැන්දට හරි අපූරුයි කියලා මම ගල දැම්ම හැටි..

පස්සෙන් පහු මලය බොට මම හේන් බතක් හරි කරලා කැන්දන් එන්ට එඤ්ඤදං..

බෝත් සප්පායම් වෙලා පල ...

නැතුවට කාරි නෑ රාලෙ ..

පොකුටා මලයා... දෙගිඩි දෙවාරුවක් නෑ ඕං.. උඹට ගිඩි ගිඩියෙන් කුඹුරු හරිකරන හැටි ඇහැල මල් පූදින්ට කලියෙං කියලා දෙන්නං..

අඩා ඉහටිය පාත් කරපායි අපේ මහතැන්ට මහබෝවේ පිහිටයි කියලා..

නැතුවට කාරි නෑ මලයා.. ගිහිං වර..

විගැහින් ගිල දාපං මාමා ඉර ගිලෙන්ට කලියෙන් එන්ට ඕනෑ..

උඹ හදන්නෙ ඉස්ගෙඩියෙ උන්ඩිකොරාන ඉන්න සේරම අදම කම්මුතු කරන්ටයැ.. බෝ දිය බීවාද..?

ඔව් මාමා.. යමිං ගමන විටක් හපමු..

කලබල නොවී පරිස්සමට යම..

ට්‍රැක්ටරයේ වේගය ටිකක් බාල කළේ කොයින් මාමාගේ බහට අවනත බව පෙන්වන්නට මිස කැමැත්තකින් නොවේ. අප ඉදිරියට දෙවැට දිගේ එමින් සිටි එතනා නැන්දා දුටු මා ට්‍රැක්ටරය නැවැත්වූයේ හේන් ඉම මොකා දුටුවත් කතා කර යාම මගේ සිරිත නිසාය.

මේකා මේ දිගේලි කරන්ට යන ගමන.. කොහේ මේ කූටකේ..?

දොළහේ කනුවට නැන්දා..

තනිවට කොයින් රාළත් ඉන්නවා නොවැ.. එමින් ගමන ගෙට ගොඩ වෙය කොල කැඳ ටිකක් තනා තියන්නං..

හොඳා..

උන්දෑ පහුකර ටිකක් යන විට කොයින් මාමා මෙහෙම පද පේලියක් අපූරුවට දිගේලි කළා..

*තණකොල අහුරක් මිටට කඩාගෙන*
*ඉඳ ඉඳ කියතෙයි*
*කොස්කටු කුල්ලක් ඉහේ තියාගෙන*
*ගාලට කිට්ටු වෙතෙයි*
*මදු කොල ගාලක් මිටට කඩාගෙන*
*ඉඳ ඉඳ කියතෙයි*
*රෑන් පොටක් ගෙන කරේ දමාගෙන*
*කණුවක ගොස් බඳිතෙයි*
*මෙච්චර පිරිමින් ගමේ සිටිද්දිත්*
*ගෑනු හරක් බඳිතෙයි*
*තෙතෙයි තෙයි ගෑනු හරක් බඳිතෙයි*

අපූරුයි මාමා උඹේ වන්නම..

**"බෝගල ගේ කතා"** දැන් තිසර ගුවන් විදුලියේ
www.sannasa.net ඔස්සේ හෝ ඔබේ දුරකතනයෙන් තිසර හා එක්වන්න


EASE YOUR TAX BURDEN, ENHANCE YOUR WEALTH

SANDAL
TAX ADVISORS PTY LTD

- TAX RETURNS
- ACCOUNTING AND BOOKKEEPING
- TAX PLANNING
- BAS AND IAS
- BUSINESS AND COMPANY REGISTRATION
- SELF-MANAGED SUPER FUND ACCOUNTING
- SET UP COMPANY, TRUST & SMSF
- FBT, WORK COVER, PAYROLL TAX, SUPERANNUATION
- BUSINESS CONSULTING

Amal Ramyanath
CPA, ACA, MBA & B.Sc
Registered Tax agent

SANDAL
SANDAL BUSINESS SOLUTIONS PTY LTD

GUSS DESIGN 9769 0099

- BUSINESS SERVICES
- PROJECT REPORTS
- BUDGET & CASH FLOW PREPARATION
- BODY CORPORATE ACCOUNTING
- FINANCIAL & MANAGEMENT REPORT
- BUSINESS PROCESS MANAGEMENT
- PROJECT EVALUATION & MANAGEMENT
- SET UP ACCOUNTING SOFTWARE
- FINANCIAL & MANAGEMENT REPORT
- BUSINESS RESTRUCTURING
- LABOUR HIRING

Namal Gomes
B.Sc. (Acct), MBA (Sri. J), ACA, ASCMA
sandalsolutions@gmail.com

PROFESSIONAL, FRIENDLY & PERSONALIZED SERVICE

66 Princess Highway
Dandenong VIC 3175

Tel 8707 5542
Mob 0451 698 725

Branch - 31 Madeline St Glen Waverley VIC 3150
Tel 8802 8818 Mob 0412 775 889 Email sandalmanagement@optusnet.com.au